**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙණු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 18 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශකර දක්වා ඇති විගණන නිරීක්ෂණ වලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.2 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.5(ආ) |
| | | 3. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබිම | 2.14 |
| 128(1) (ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට ද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමට ද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබිම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2 |
| | | 2. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.8 |

| | | | |
|---|---|---|---|
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවීම | 2.15 |
| 128(1) (ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.10 (අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම<br>2. අවිධිමත් ගනුදෙනු | 2.7<br>2.5 |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිළධාරීන් එවකට වලංගු නීතිය හා නියමටන් අනුව ඇප තබන බව. | අදාළ නිලධාරීන්ගේ ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.17 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ හා පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 62.160 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 61.860 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| | **සැපයීම්** | | | |
| 1201 | - ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 7.200 | 7.050 | 0.150 |
| 1203 | - ආහාර පාන හා නිල ඇඳුම් | 0.460 | 0.432 | 0.028 |
| 2102 | - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 3.200 | 3.123 | 0.077 |
| 2103 | - යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 1.300 | 1.283 | 0.017 |
| 2104 | - ගොඩනැගිලි ඉදිකිරීම | 50.000 | 49.972 | 0.028 |
| | එකතුව | 62.160 | 61.860 | 0.300 |

### 2.1.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූලධන ප්‍රතිපාදන මත කාර්යාල පරිශ්‍රයේ සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් නොවුණු කාර්යක් බවට හඳුනා ගත හැකි විය. මෙම කාර්යය සඳහා මිල කැඳවීමේදී ද, ලියාපදිංචි ආයතන 66 න් 05 කින් පමණක් ලංසු ලබාගෙන ඇති බවට වාර්තා වී තිබුණි. තවද, මෙම 05 දෙනා වෙත ලිඛිතව ලංසු ඇරයුමක් යවන ලද බවට සාක්ෂි නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ලබාගෙන තිබුණු කාර්යසාධන සුරක්ෂණයද අදාළ රක්ෂණ ආයතනය විසින් සනාථ කර තිබූ පරිදි ව්‍යාජ ලියවිල්ලක් බව නිරීක්ෂණය වූ අතර අදාළ වැඩ කොටස සහතික කිරීමේදී නියමිත දින වකවානු සඳහන් කර නොතිබුණි.

**2.2 වත්කම් කළමනාකරණය**

**වාහන උපයෝජනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 13 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 190,691 ක් ධාවනය කර තිබුණි. එම වාහන සඳහා ඉන්ධන හා ලිහිසි තෙල්ද, වාහන සේවා කිරීම, වාහන අළුත්වැඩියා හා වාහන රක්ෂණය කිරීම සඳහා එකතුව රු. 4,953,127 ක් වැය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු. 26 ක් වැය කර තිබුණි.

**2.3 බැදීම් හා බැරකම්**

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 25.58 ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 0.80 ක බැදීම් ඇතිකර ගෙන තිබු අතර සමස්ථ බැදීම් ප්‍රමාණය රු. මිලියන 1.21 ක් විය.

**2.4 අවිධිමත් ගනුදෙනු**

ජාතික ඒකාබද්ධ හා ප්‍රතිසංධාන අමාත්‍යාංශයට අයත් ජාතික සමඟිය හා සංහිඳියා කාර්යාංශයෙන් ලබාදෙන ලද අරමුදල් වලින් ක්‍රියාත්මක කරන ලද වැසි ජල ටැංකි ලබා දීමේ ව්‍යාපෘතියේදී වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උප්පුරල් ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරි විසින් ප්‍රතිලාභීන් 15 දෙනෙකුට ලැබිය යුතු රු. 494,000 ක් වූ ප්‍රතිලාභ ඔවුන්ගේ ගිණුම්වලට බැරවීමෙන් පසු නැවත එය ප්‍රතිලාභින්ගෙන් ලබා ගෙන අදාළ ග්‍රාම නිලධාරි විසින් එම කාර්යය වෙනුවෙන් වියදම් කර තිබුණි.

**2.5 විසඳා නොතිබුණු විගණන ඡේද**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2014 | 3.9 (අ) | **වෙනත් ආයතනය සතු වත්කම් නීත්‍යානුකූලව පවරා නොදීම.**<br>2011 ඔක්තෝබර් මස දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පවත්වා ගෙන ගිය ත්‍රිකුණාමලය ජේදුරු කොටුවේ අක්කර 372 ක භූමිය හා එහි පිහිටි ගොඩනැගිලි හා නිවාස ඇතුලත්ව පුරා විද්‍යා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එහි අයිතිය පවරා දෙන ලෙස පුරා විද්‍යා අධ්‍යක්ෂක ජනරාල්ගේ 2011 ජනවාරි 04 දිනැති අංක M/EP/1/7A දරන ලිපියෙන් දැනුම් දී ඇතත් 2017 සැප්තැම්බර් 05 දක්වා නිත්‍යානුකූලව පවරා දී නොතිබුණි. |

| | | |
|---|---|---|
| 2014 | 3.9 (ආ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි ඉඩම රාජ්‍ය දැව සංස්ථාවට අයත්ව පවතින නමුත් 2017 සැප්තැම්බර් 05 දක්වා එහි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2014 | 3.13(ඉ) | විල්ගම කැලය මැද පරිසර උද්‍යානයක් වටා අලිවැට සකස් කිරීම සඳහා ලබා දී තිබූ රුපියල් මිලියන 3.6 අත්තිකාරම් මුදලින් මිලදී ගෙන තිබූ උපකරණ අනාරක්ෂිතව නිශ්කාර්යව පැවතුණි. වර්තමානය වන විට අදාල පරිසර උද්‍යානයේ ඉදිකිරීම් නතර කර තිබුණි. |

## 2.6 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

(i). මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ඇළුමිනියම් සවි කිරීම හා ටයිල් ඇතිරීම් යන කාර්යයන් ඉටු කර නොතිබියදී පිලිවෙලින් රු.1,666,800 හා රු.212,598 වශයෙන් එකතුව රු.1,879,398 ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ අතර ගොඩනැගිල්ලේ අත්තිවාරමේ කළු ගල් වැඩ සඳහා රු.74,120 ක මුදලක් ද ඇතුළුව වැඩිපුර ගෙවා තිබූ සම්පූර්ණ මුදල රු. 1,953,518 විය.

(ii). මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීම කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැරීම නිසා එම දිනට ඉතිරි වැඩවල වටිනාකම ලෙස ගණනය කරන ලද රු. 12,272,950 කින් සියයට 25 ක් වූ රු.3,068,237 ක දඩ මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට තීරණය කර තිබුණි. එම මුදලින් රු.1,500,314 ක් කාර්ය සාධන සුරක්ෂණය මුදල් කර ගැනීමෙන් අයකරගෙන තිබුණු බවට පැහැදිලි කර ඇතත් ඉතිරි රු.1,567,923 ක මුදල අයකර ගෙන ඇති බව නිරීක්ෂණය නොවීය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි 2 ක් වෙනුවෙන් 2015/2016 සහ 2017 තක්සේරු වර්ෂ සඳහා වරිපනම් බදු අදාල වර්ෂවල ජනවාරි මාසයේදී නොගෙවා ප්‍රමාද වී ගෙවීම නිසා රු.24,925 ක් වූ සියයට 10 ක වට්ටම් ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණයන් පහත පරිදි විය.

(i). මෙම ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි කෑම කාමරය සහ සමෘද්ධි අංශය සඳහා වෙන් කරන ලද කොටසේ වර්ග මීටර් 54.106 ක ටයිල් අතුරා තිබුණු නමුත් මිණුම් පත්‍රවල සඳහන් පරිදි වර්ග මීටර් 76.328 ක් සඳහා ගෙවීම් කිරීම නිසා රු. 66,666 ක් වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණි.

(ii). මෙම ගොඩනැගිල්ලේ බිම් මහලේ සහ පළමු මහලේ බිත්ති ඉදිකිරීම්වල මිණුම් ගැනීමේදී දොර, ජනෙල් වෙනුවෙන් වර්ග මීටර් 92.19ක් අඩු කල යුතු වුවත් මිණුම් පත්‍රවල වර්ග මීටර් 73.14 ක් ලෙස අඩු කර ගණනය කිරීම නිසා රු.28,575 ක වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඇතුළු වරාය පාරේ පිහිටි අංක 3 B සහ 1 B දරණ නිවාස සඳහා මාසයකට රු. 4,000 බැගින් ආර්ථික කුලියක් අය කළ යුතු බවට ප්‍රධාන තක්සේරුකරු විසින් නිර්දේශ කර තිබුණු නමුත් එම නිවාසවල පදිංචිකරුවන්ගෙන් පිලිවෙලින් රු.2,200 න් සහ රු.1,000 බැගින් නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි. එම නිවාස සඳහා 2012 ජනවාරි සිට 2018 අප්‍රේල් දක්වා අයවිය යුතු හිඟ කුලිය රු.364,800 ක් ලෙස ගණනය කර තිබුණි.

(ඉ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කර තිබු පනිච්චිකුලම මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේදී ABC ඝණ මීටර් 1,162.60 ක් සපයා මාර්ගය මත අතුරා තැලීම සඳහා රු.4,930,237 ක් ගෙවා තිබුණු නමුත්, සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී අනාවරණය වූ පරිදි යොදා තිබු ABC ප්‍රමාණය ඝණ මීටර් 797.8 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව, ABC ඝණ මීටර් 364.8 ක් වෙනුවෙන් VAT බදු ඇතුලත්ව රු. 1,779,058 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2.7 මහජනයා වෙත සේවා ඉටු කිරිම

දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ තුළින් අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු නමුත්, පිළියෙළ කර තිබු වෙබ් අඩවිය තුළින් මහජන පැමිණිලි ලබා ගැනීමේ පහසුකම් ඇතිකර නොතිබුණි.

## 2.8 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| 2013 | පුනරාවර්තන | 295.70 | 281.43 | 14.27 | 4.82 |
| | මුලධන | 675.30 | 643.13 | 32.17 | 4.76 |
| | **එකතුව** | **971.00** | **924.56** | **46.44** | **4.78** |
| 2014 | පුනරාවර්තන | 291.29 | 286.32 | 4.97 | 1.7 |
| | මුලධන | 38.40 | 36.74 | 1.66 | 4.3 |
| | **එකතුව** | **329.69** | **323.06** | **6.63** | **2.0** |
| 2015 | පුනරාවර්තන | 352.92 | 344.12 | 8.80 | 2.49 |
| | මුලධන | 53.30 | 52.32 | 0.98 | 1.89 |
| | **එකතුව** | **406.22** | **396.44** | **9.78** | **2.41** |
| 2016 | පුනරාවර්තන | 378.00 | 367.20 | 10.80 | 2.86 |
| | මුලධන | 54.00 | 53.52 | 0.48 | 0.88 |
| | **එකතුව** | **432.00** | **420.72** | **11.28** | **2.61** |
| 2017 | පුනරාවර්තන | 380.28 | 373.87 | 6.40 | 1.68 |
| | මුලධන | 64.00 | 63.00 | 1.00 | 1.56 |
| | **එකතුව** | **444.28** | **436.88** | **7.40** | **1.66** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). අධි ප්‍රතිපාදන සලසා තිබීම

------------------------------

වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.මිලියන 1.738 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 3.836 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 65 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ii). වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

--------------------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ 15 ක් හා දෙපාර්තමේන්තු 06 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 2222.23 ක්, රු. මිලියන 49.39 , ක් වශයෙන් එකතුව රු. මිලියන 2,271.62 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් එකතුව රු.මිලියන 1519.61 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබු ප්‍රතිපාදනවලින් රු.මිලියන 752 ක් හෙවත් සියයට 33 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

- **ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (වැය ශීර්ෂය 151-2-3-60-2506) -** ධීවර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

**--------------------------------------------------------------------------**

(i). කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සාගර පුර ධීවර ගම්මානයේ නව නිවාස 27 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රතිලාභින් 21 දෙනෙකු වෙත රු.5,190,000 ක් ගෙවා තිබුණු නමුත් එම නිවාසවල ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

(ii). සාගර පුර ධීවර ගම්මානයේ නිවසක වර්ගඵලය වර්ග අඩි 510.50 ක් ලෙස ඉදිකළ යුතු වුවත් එයට අඩු වර්ගඵලයකින් යුතුව ඉදිකිරීම් කර තිබුණු ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත ඒ පිළිබඳව පරීක්ෂා නොකර රු.955,000 ක් ගෙවීම් කර තිබුණි.

(iii). සාගරපුර ධීවර ගම්මානයේ නිවාස 27 ක් වෙත නල ජලය සැපයීම සඳහා ලීටර් 10 000 PVC ජල ටැංකියක් මිලදී ගැනීම සඳහා රු.165,000 ක් ගෙවා තිබුණු නමුත් වෙළඳපල මිල පිළිබඳව අන්තර්ජාල තාක්ෂණය අනුව ලබාගත් කරුණු අනුව එම වර්ගයේ ජල ටැංකියක් රු. 104,500 කට මිලදී ගැනීමට හැකියාව තිබුණු බැවින් රු. 60,500 ක අධි ගෙවීමක් සිදුව තිබු බව නිරීක්ෂණය විය.

(iv). කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 87 අග්බෝපුර සුහද මාවත ඉන්ටර්ලොක් ගල් අතුරා සකස් කිරිම සඳහා ඇස්තමේන්තුවේ විෂයය අංක 8 අනුව 25N/mm2 ඝනකම සහිතව මි.මී.75 වැලි අතුරා සකස් කරන ලද මතුපිට මත වර්ග මීටර් 233.22 ක් ප්‍රමාණයට පමණක් ඉන්ටර්ලොක් ගල් අතුරා තිබුණු නමුත් වර්ග මීටර් 262.50 ක ප්‍රමාණයක ඉන්ටර්ලොක් ගල් ඇතිරූ බවට කාර්මික නිලධාරිවරයා විසින් සහතික කිරීම නිසා වර්ග මීටර් 29.28 ක් වෙනුවෙන් රු.65,616 ක වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණි.

- **ජාතික ඒකාබද්ධ හා ප්‍රතිසංධාන අමාත්‍යාංශය ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය(වැය ශීර්ෂය - 165) වැසි ජල ටැංකි ලබා දීමේ ව්‍යාපෘතිය**

  ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක ප්‍රතිලාභීන් 100 දෙනෙකු වෙත වැසි ජල ටැංකි ලබා දීම සඳහා 2017 වර්ෂයේදී රු, 9,643,575 ක් වියදම් කර තිබුණු නමුත් පහත හේතු මත මෙම ව්‍යාපෘතියේ අරමුණට අනුකූල වන පරිදි ක්‍රියාත්මක වී නොතිබුණු බව ක්ෂේත්‍ර විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය විය.

(i). මෙම වැසි ජල ටැංකි වල එක්රැස් කරන ජලය පානීය කටයුතු සඳහා භාවිතා නොකර මුදල් ගෙවා පිරිපහදු කළ ජලය ලබා ගැනීම.

(ii). ජල ටැංකි සවිකිරීම සහ භාවිතය පිලිබඳ ප්‍රතිලාභීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් කර නොතිබීම.

(iii). මෙම ව්‍යාපෘතියට අදාළ ජල ටැංකි මිලදී ගැනීමේදී පිරිවිතර වල අදාළ විස්තර ඇතුලත් නොවීම නිසා ආර්ථික බවින් යුතුව කටයුතු කිරීමට නොහැකි විය.

## 2. 9 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 35.00 | 34.07 | 23.00 | 22.74 | 100.00 | 100.00 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 1,466,256 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ආ) විධිවිධානවලට පටහැනිව ණය නිකුත් කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර එක් නිළධාරියෙකුට රු. 285,470 ක ආපදා ණය මුදලක් ගෙවා තිබුණි.

**(ඇ) ස්ථානමාරුවීම් ලබා පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අයකර නොගැනීම**

(i). වෙනත් කාර්යාලවල සේවය කරමින් සිට මෙම කාර්යාලයට ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්ගෙන් එකතුව රු.208,013 ණය ශේෂ 2004 අගෝස්තු 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මාසික ගිණුම් සාරාංශ මගින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින් 15 දෙනෙකු වෙත ගෙවන ලද රු.3,636,160 ක ආපදා ණය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3 වන වගන්තිය සහ පොදු 272 ණය ගිවිසුමේ 2 වන වගන්තියට අනුව ණය ලබා ගන්නා තැනැත්තා විසින් ණය මුදල අදාළ කාරණයට යෙදූ බවට සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

**2.10 අග්‍රිම ගිණුම**

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසික ලබා ගැනිමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසික ඉල්ලුම්කල අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| මාසය | සැලසුම් කල පරිදි ඉල්ලුම් කල යුතු අග්‍රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය | ලැබී තිබුණු අග්‍රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ජනවාරි | 95.34 | 95.34 | 82.20 | (13.14) |
| පෙබරවාරි | 98.50 | 98.50 | 83.21 | (15.30) |
| මාර්තු | 266.30 | 266.30 | 135.00 | (131.30) |
| අප්‍රේල් | 197.22 | 197.22 | 168.30 | (28.92) |
| මැයි | 256.62 | 256.62 | 157.46 | (99.16) |
| ජුනි | 165.22 | 165.22 | 139.40 | (25.82) |

| | | | | |
|---|---|---|---|---|
| ජූලි | 354.32 | 354.32 | 183.10 | (171.22) |
| අගෝස්තු | 501.10 | 501.10 | 233.33 | (267.73) |
| සැප්තැම්බර් | 407.34 | 407.34 | 249.58 | (157.76) |
| ඔක්තෝබර් | 304.50 | 304.50 | 304.10 | (0.40) |
| නොවැම්බර් | 658.10 | 658.10 | 329.20 | (328.90) |
| දෙසැම්බර් | 446.73 | 446.73 | 414.02 | (32.71) |
| එකතුව | 3751.29 | 3751.29 | 2478.9 | (1272.39) |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂය තුල රු. මිලියන 3751.29 ක මුදලක් අග්‍රිම ලෙස ලබාගැනීමට සැලසුම් කර තිබුණු අතර එම සම්පූර්ණ මුදලම ඉල්ලා තිබුණි. එහෙත් නිදහස් කර තිබුණු අග්‍රිම ප්‍රමාණය රු. මිලියන 2478.9 ක් වීම හේතුවෙන් නොලැබී ඇති රු. මිලියන 1272.39 ක මුදලින් අපේක්ෂාකළ කාර්යයන් ඉටුකරගත් ආකාරය විගණනයේදී ප්‍රශ්නගත වේ.

(ආ) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 04 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු. 305,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවී මාස 01ක සිට මාස 02ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් එම අග්‍රිම නිරවුල් කර තිබුණි.

## 2.11 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 101.885 ක් වූ අතර වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.මිලියන 3.18 ක්වූ තැන්පතු 133 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.12 බැංකු ගිණුම් මෙහෙයවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බැංකු ගිණුම් 04 කට අදාළව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ මාස 6 ඉක්මවූ එකතුව රු.මිලියන 15.561 ක් වටිනා චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| i. ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ/ මුදල් රෙගුලාසි 502 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| ii. ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (ii) | පවත්වා නොතිබුණි. |
| iii. හානි පිලිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |

**2.14 අනුකූල නොවීම්**

**2.14.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) | පරිච්ඡේද xix හි 5.2.1 ජේදය | 784,800 (2018 අප්‍රේල් දක්වා පමණක් නිවාස කුලී ගණනය කර ඇත.) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පේදුරුකොටුව මාර්ගෝසා ටෙරස් හි පිහිටි රජයේ ස්ථිර නිවාස 5 ක පදිංචි වී සිටින තැනැත්තන්ගෙන් නිවාස කුලී අයකර ගෙන නොතිබීම. |
| (ii) | පරිච්ඡේද xix හි 5.2.1 ජේදය | 2,502,550 (2018 අප්‍රේල් දක්වා පමණක් නිවාස කුලී ගණනය කර ඇත.) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසවල පදිංචි නිලධාරීන්ගේ වැටුපෙන් මාසිකව 12 ½ බැගින් නිවාස කුලී සඳහා අයකළ යුතු වුවත් විශේෂ හේතුවක් නොමැතිව ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව මත රජයේ නිවාස 12 ක පදිංචි කරුවන්ගෙන් ආර්ථික කුලියක් අයකිරීම. |
| (iii) | පරිච්ඡේද xix හි 7.2 ජේදය | - | පොදු නිවාසවල පදිංචි කරුවන්ගේ බදු කාලය වූ වර්ෂ 5 ක් ඉක්මවා පදිංචි වී සිටින තැනැත්තන්ගෙන් දණ්ඩන කුලියක් අය කර ගත යුතු වුවත් නිවාස 18 කින් එසේ අයකර ගෙන නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) | 03 (I) ඡේදය | 8,426,938 (ඇස්තමේන්තුගත වටිනාකම) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ (වැය ශීර්ෂය 271-1-0-2014) ප්‍රතිපාදන වලින් 2017 වර්ෂයේදී සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකර තිබුණු නමුත් ඒ පිළිබඳව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ, ක්‍රියාකාරී සැලැස්මේ හා අයවැය ලේඛණයෙහි විස්තර කිසිවක් සඳහන් කර නොතිබීම. |
| (ii) | 50 (2) ඡේදය | - | ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු හැකිතාක්දුරට සම්පූර්ණයෙන්ම නිවැරදි බවට වගබලා ගත යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (වැය ශීර්ෂය 271-1-0-2014) යටතේ මුතූර් හා කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක සඳහා පිලිවෙලින් රු.මිලියන 25.5 සහ 24.5ක ප්‍රතිපාදන සලසා ගෙන ගෙන එයින් රු.මිලියන 8.42 ක් ඉතිරි කර තිබීම. |
| (iii) | 371 (2) (ඇ) ඡේදය | 305,000 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී ලබා දී තිබුණු අත්තිකාරම් මුදල් දින 10 සිට දින 24 කාලසීමාවක් දක්වා ප්‍රමාද වී පියවා තිබීම. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ** | | |
| | ඡේද අංක 7.9 II (ආ) | 12,272,950 (මුළු කොන්ත්‍රාත් ගිවිසුම්ගත වටිනාකම රු. 30,006,285 ක් වූ අතර කොන්ත්‍රාත්තුව පැහැර හරින අවස්ථා වනවිට තිබුණු ඉතිරි වැඩ වල වටිනාකම) | මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් අතර විචලනය සියයට 20 - සියයට 52 වූ නමුත් එම අයිතමයන් පිළිබඳව අවධානය යොමු නොකර එම අතාත්වික අනුප්‍රමානයන් මත කොන්ත්‍රාත්තුව නිර්දේශ කිරීම නිසා නියමිත වේලාවට වැඩ අවසන් නොකර කොන්ත්‍රාත්තුව පැහැර හැර තිබුණි. එම නිසා වෙනත් කොන්ත්‍රාත් කරුවෙකු ලවා ඉතිරි වැඩ කොටස් ඉටුකරවා ගැනීමට සිදු වී තිබුණි. |

## 2.15 මානව සම්පත් කළමනාකරණය

### 2.15.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 326.725 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.338,927 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 60 | 49 | 11 | - |
| (ii) | තෘතියික මට්ටම | 29 | 14 | 15 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1022 | 777 | 245 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 145 | 118 | 27 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 06 | - | 05 |
| | එකතුව | 1257 | 964 | 298 | 05 |

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට ආයතනය විසින් කටයුතු කර නොතිබුණි.

## 2.16 රජයේ නිලධාරීන් ඇප තැබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුදල් භාරගැනීම සහ භාරව සිටින නිලධාරීන් සහ ගබඩාව භාරව කටයුතු කරන නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැන්පත් කර නොතිබුණි.